Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව- සති පාසැල

විෂය - බුද්ධ ධර්මය

2021 සැප්තැම්බර් මාසය දෙවන සතිය

ශ්‍රේණිය - 3

සැකසුම - බලංගොඩ අධ්‍යාපන කලාපය, මල්ලිකා රත්නායක (ප්‍රා.ගු.උ)

"ගත හැකි දෙය වැඩට

අහක නොදමනු කිසි විට ( 19 පාඩම)

අපි මේ පාඩමේ ඇති කවිය ශබ්ද නගා තාලයට ගායනා කරමු නේද ?

ගත හැකි දෙය වැඩට
අහක නොදමනු කිසි විට
වැඩට නැති දෙය නුඹට
දෙනුව ඉන් වැඩ ගන්න අය හට

(සිරිත් මල් දම)

( ඇම්.ඇල් සිල්වා ගුරු මුහන්දිරම් මහතා)

පුතේ, දුවේ මේ කවිය ලස්සන අත් අකුරින් බුද්ධාගම පොතේ ලියමු නේද ?

කවියේ තේරුම වැඩිහිටියන්ගෙන් අහලා දැන ගනිමු.

**වාචික පිළිතුරු දෙන්න**

01. මේ කවිය ලියා ඇති පොතේ නම කියන්න.

02. මෙම කවිය ලියන ලද කතුවරයාගේ නම කියන්න.

03. එම කවි ලියා ඇති පොත සොයා ගෙන එහි ඇති කවි දිනපතා ගායනා කරන්න.

**අපි හොඳ ගති ගුණ ඇති ළමුන් වෙමු.**

දුවලා, පුතාලට බුදු සරණයි !